

# ශ්‍රමණ දූශ්ශීල
# සරණාගමන විභාගය.

ශ්‍ර ම ණ

# දුශ්ශීල සරණාගමන විභාගය

නොහොත්

බටපොතේ සිදුවූ විවාදයේ සංක්ෂෙප ප්‍රවෘත්තියසහා සෙවනා

දියෙන් යුක්තව කරණ දුශ්ශීල උපස්ථානයේ

දෙස්දක්වීමක්

ශ්‍ර ම ණ දු ශ් ශී ල ඝා හ ට

සරණාගමනාදි ශාසනිකගුණයක් නැතිබැව් දැක්වීමත්ය.

---

පාණදුරේ පී. ඒ. පීරිස් මහත්මයා විසින්

ස ම්පා දි ත යි.

---

සී. එච්. සිරිවර්ධන මහත්මයා විසින්

මුද්‍රණකරවා ප්‍රසිද්ධකරණලදි.

---

ලක්රිවිකිරණ මුද්‍රාලයෙහි අච්චුගස්වනලදි.

---

1892.

*Price* 12 *Cts.*

# බටපොතේ වාදය.

### නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

මෙම විවාදය ගැණ මුලින් ලියුම් ගණුදෙනු කරගෙණ තිබුණු ලෙස වර්‍ෂ 1892–8–29. වෙනිදින සියම්පක්‍ෂයෙන් බැදිගම රතනපාල ස්ථවිරාදි 25 නමක් පමණ බටපොතේ විහාරස්ථානයේ ධර්‍මශාලාවට පැමිණියෝය. රාමඤ්ඤනිකායපක්‍ෂයෙන් මූඩගමුවේ සිරිනිවාස ස්ථවිරාදි පස්නමක් පමණ පැමිණ සිටියෝය. දෙපක්‍ෂයෙන් රතනපාල, උඩුගම්පල සුවණ්ණජෝතාභිධාන යන දෙනම කථාවට පත්වූවෝය. මුල් ලියුම්වල සඳහන්වූලෙස ශ්‍රමණ දුශ්ශීල උපස්ථානය සහ ඔහුගේ නිස්සරණය ගැණ කථාව පටන්ගෙණ දෙපක්‍ෂයෙන් වාද මාතෘකා පිහිටවා ගැණිමට රතනපාල ස්ථවිරයෝ රාමඤ්ඤනිකාය පක්‍ෂයෙන් මුල් මාතෘකා ඉල්ලා හිටියේය. සුවණ්ණජෝතාභිධාන ස්වාමීන් විසින් පානදුරේ විවාදයේදී දුශ්ශීල උපස්ථානය ගැණ අමරපුරනිකාය පක්‍ෂයට දෙනලද මාතෘකා ලියවිල්ලම කියවාදෙනලදී. ඒමෙසේයි.

1. සිල්නැති ඇතීයෙන් දුශ්ශීලයායයිදක්වනලද ඡේදගාමී ශ්‍රමණ දුශ්ශීලයාහට ඒබව දත දත විනයෙහි භික්‍ෂූන්ට බුදුන්වසින් අනුදත වදාළ චීවර, පිණ්ඩපාත, ශයනාසන, ගිලානප්‍රත්‍යය යන සිව්පස දන යෙන් *a* සංග්‍රහ කරණ හෙවත් දන්දෙන දායකයා *b* මරණින්මතු අපායෝත්පත්තිවන බවද.

2. එම ශ්‍රමණදුශ්ශීලයාහටම සෙවනය, භජනය, පයිරුපාසනය සහිතව උපස්ථාන කරණ හෙවත් දන්දෙන දායකයා මරණින්මතු අපායෝත්පත්ති වනබවද.

3. එබඳු දුශ්ශීලයාට නමුත් සිඟා ගෙදොරට පැමිණි කල්හි "නොදීමෙන් ත්‍යාගය කඩවෙයි" යන අදහසින් සූත්‍රයෙහි නියමකළ අන්න පානාදි යම්කිසි දනවස්තුවක් යාචකවශයෙන් සලකා කැමතිනම් දියයුතු බවද.

4. ගෙදොරට පැමිණිකල්හි නමුත් අසුන් පණවා වැඩහිඳුවා සිලවන්තයෙකුට මෙන් වැඳුම් පිදුම්කොට විනයෙහි නියම චීවරාදි ප්‍රත්‍ය යෙන් උපස්ථාන කරණවානම් හෙවත් දන්දෙනවානම් එයද දෝෂ සහිතබව කියම්හ.

5. දුශ්ශීලයාගේ නිසරණයගැණ "ඡේදගාමී ශ්‍රමණදුශ්ශීලයා සරණාගමන පටන්කොට ඇති සියළු ගුණයෙන් පිරිහුණු නිරාස පුද්ගල යෙක් බවද කියම්හ.

---

*a*. *b*. පානදුරේ වාදයේදී "මහනා" යන වචනය තිබෙනතුරු ඒ ලියවිල්ල බාරගන්ට බැරියයි වැලිගම තෙරිඳු යම්සේ කීයේද; එමෙන් *a*. *b*. මේ තැන්වලට "පින්සලකා" "ඒ හේතුවෙන්" යන වචනදෙක ලියාදෙනතුරු "මේ මාතෘකා බාරගන්ට බැරියයි" රතනපාලතෙරිඳු කීයේය. මාතෘකාවල අදහස එසේම නමුත් ඔහු සතුටුකිරීමට සුවණ්ණජෝතාභිධාන ස්වාමීන්විසින් ඊට අවසර දෙනලදී.

ඊට අනතුරුව රතනපාල තෙරුන් විසින් සටකී මාතෘකා වචනාව මෙසේ වෙනස්කොට දෙනලදහ.

1. සිල්නැති අත්‍ථයෙන්.........පින් සලකා සංග්‍රහ කරණ හෙවත් දන්දෙන දායකයා ඒ හේතුවෙන් මරණින් මතු අපායෝත්පත්ති නොවන බවද.

2. ඒ ශ්‍රමණ දුශ්ශීලයාහටම සෙවන, භජන, පයිරුපාසනාසහිතව ඔහුගේ දෘෂ්ටානුගතියට නොපැමිණ c පින් සලකා උපස්ථාන කරණ .........ඒ හේතුවෙන් අපායෝත්පත්ති නොවන බවද.

3. ගෙදෙරට පැමිණිකල්හි නමුත් පින් සලකා.........එයද දෝෂ රහිතබව කියම්හ.

4. ජේදුගාමිණී ශ්‍රමණ දුශ්ශීලයා.........සියලු ශ්‍රාමාන්‍ය ගුණයෙන් පිරිහුනු නිරාස පුත්ගලයෙක් වෙනවාමිය ඒ පුත්ගලයාගේ පැවිද්දීමට මත්තෙන් ගිහි භූමියේදී සමාදන්වූ සරණාගමනය දෘෂ්ටි විපත්තියෙන් වත් ස්කන්ධ භෙදයෙන්වත් නැතිවෙනතුරු ඇතිබව කියම්හ. b

ඊට අනතුරුව රතනපාල තෙරුන් විසින් සුවර්‍ණජෝතායාසභ ස්වාමින්වහන්සේගෙන් "එම මාතෘකා විස්තාරකරවීම පිණිස" යයි ප්‍රශ්න කීපයක් අසනලදහ—ඒ මෙසේයි.

1. රතනපාල—ප්‍රශ්න—ශ්‍රමණ දුශ්ශීලයා පිළිබඳ කරණ මේ කථාවේ බුද්ධශාසනයෙහි ශ්‍රමණ දුශ්ශීලයෙක් ඉන්නවාද? නැද්ද?

සුවර්‍ණජෝතායාසභ—උත්තර—වොහාර වශයෙන් ශ්‍රමණ දුශ්ශීලයෙක් සිටිනවා.

2. ර. ප්‍ර. ශ්‍රමණ දුශ්ශීලයා බෞද්ධයෙක්ද? අබෞද්ධයෙක්ද? සු. උ. ඔහු දුස්සීල භූමියෙහි සිටිනතුරු (නියම) බුද්ධාගම්කාරයෙක් නොවෙයි.

3. ර. ප්‍ර. එසේනම් අන්‍යාගම්කාරයෙක්ද? සු. උ. අන්‍යාගම්කාරයන්ට අනුලෝම පුත්ගලයෙකි.

---

c අදෙමයි. උපස්ථාන දෘෂ්ටානුගති යනාදියෙහි අර්ත්‍ථ තමුන්ම නොදන කිවායයි මෙයින් හැඟේ. මන්තට්වත් මෙසේ දනගතයුතුයි. දුස්සීලයන් වෙත පැමිණ ඔවුන්ට චීවරාදි ප්‍රත්‍යයෙන් සංග්‍රහකිරීම දුශ්ශීල උපස්ථානයවේ. "දිට්ඨානුගතිං" යන්නෙහි "දෘෂ්ටිය අනුවයාමයයි" පදගතාර්ත්‍ථනමුත් ඔහුගේ ඇවතුදනුශාසනාවෙහි පිහිටීම එහි භාවාර්ත්‍ථයි. දුස්සීලයන් සේවනයකිරීම තහනම්කළාවූ තථාගතතෙමේ "ගෙදෙරට පැමිණි දුස්සීලයන්ට හිතමත් දියයුතුයයි" වදාළේය. "පින්සලකා දන්දීම පිණිස දෘෂ්ටානුගතියට නොපැමිණ දුස්සීල සෙවනය කටයුතුයයි නොවදාළේය " පින් සලකා දුස්සීල සෙවනාදිය කරමින් දෘෂ්ටානුගතියට නොබැඳී දන්දීම නිවරදිය " යනු මෙකල වසන ශ්‍රමණ දුශ්ශීලයන්ගේ දෘෂ්ටියකි, එය එසේ බාරගත් දායකයා මෙහි ඒකාන්තයෙන් දුස්සීලයන්ගේ දෘෂ්ටානුගතියට පැමිණියේවේ.

b අදෙමයි, මේ මොන විහිලු කථාවක්ද? නිරාස ආසංස විගතාසයයි වදාළ පුත්ගලත්‍රිකයෙහි ශ්‍රමණ දුශ්ශීලයා නිරාස පුත්ගලයාබවද; ගිහි තිසරණය ඇති පුත්ගලතෙම සෝවාන්මාර්ගයෙහි පිළිපදින්නෙක් හෙයින් ශෛක්‍ෂ පක්‍ෂයට ඇතුළත්වීමෙන් ආශංස පුත්ගලයාබවද; ප්‍රකාශවෙයි. රතනපාල තෙරුන්ගේ මේ කථාවෙන් ශ්‍රමණ දුශ්ශීලයා එකවරකට නිරාස පුත්ගලයායයිද එකවරකට ආසංස පුත්ගලයා යයිද හැඟේ. මෙසේ බොරු දෙසන්නේ කුමටද?

4. ර. ප්‍ර. “සඞ්ඝාහි දුස්සීලො නාම නත්‍ථි දුස්සීලාව පන උපාසකා” යනාමේ පාඨයෙන් ප්‍රකාශකරණ පරමාර්ථය කුමක්ද?:—සු. උ. උපාසකාසින් අතර දුස්සීල උපාසකයෝය, සිල්වත් උපාසකයෝයයි දෙකොටසක් සිටිනවා. සඞ්ඝයා අතර දුස්සීලවූ සංඝයාය, සිල්වත් සංඝයායයි දෙකොටසක් නෑ. ඔනු අපේ අදහසයි.

5. ර. ප්‍ර. සතර පාරාජිකාපත්තියෙන් සිලවිපැත්තිය වෙනවාමිස දෘෂ්ටිවිපැත්තියක් වෙනවාද?—සු. උ. සතර පාරාජිකාවෙන් දෘෂ්ටි විපත්තියක් නැහැ.

6. ර. ප්‍ර. දෘෂ්ටි විපැත්තියටවත් ජීවිතක්‍ෂයටවත් නොපැමිණි ලෞකික සරණාගමනය බිඳෙනවාද?—සු උ. උපසම්පන්න භික්ෂූන්ගේ සරණාගමනය බිඳෙනවා

7. ර. ප්‍ර. “යෙසං භික්ඛු.........යථාපුරෙ තථා පච්ඡා පාරාජිකො හොති අසංවාසො” යනාමේ පාලියෙහි භාවය කුමක්ද?—සු. උ. උපසම්පදා වීමට ප්‍රථමයෙන් යම්සේ ඔහු අනුපසම්පන්නද පාරාජිකා ඇවතට පැමිණියාසින් පසු එලෙසම අනුපසම්පන්නයා බවයි.

8. ර. ප්‍ර. ශ්‍රමණදුශ්ශීලයා ගෙදෙරට පැමිණිකල්හි නොදීමෙන් ත්‍යාගය කඩවෙයි යන අදහසින් සූත්‍රයෙහි නියමකල අන්නපානාදී යම්කිසි දානවස්තුවක් යාචකවශයෙන්වත් සලකා දුන්කල එය තුදුස් පුත්ගලික දානයෙන් කවර පුත්ගලික දානයකට අයිතිද?—සු, උ. දහතුන්වෙනි පුත්ගලික දානයට ඇතුලති.

තදනන්තරව සුවණ්ණජෝතාසභ ස්වාමින්වහන්සේ විසින්ද යට දක්වන ප්‍රශ්න කිපය රතනපාල තෙරුන්ගෙන් අසනලදහ.

1. සුවණ්ණජෝතාසභ—ප්‍රශ්න—ශ්‍රමණ දුශ්ශීලයා සේවන භජන පයිරුපාසන කිරීම බුදුන් වදලාද?—ර. උ. නෑ. *a*

2. සු. ප්‍ර. සෙවනය කියන්නේ කුමක්ද?—ර. උ. එහි සාමාන්‍ය තේරුම සමීපයට එළඹීම *a* යනුයි: එහි විශේෂ තේරුමුත් ඇතිවිය යුතුයි.

3. සු. ප්‍ර. “ජිගුච්ඡිතබ්බො න සෙවිතබ්බො” යනාදි පෙලෙහි “න සෙවිතබ්බො” යන වචනය අට්ඨකථාචාරීන්වහන්සේ විසින් කොලෙස තෝරාතිබේද?—ර. උ............“න උපසංකමිතබ්බො” *a* යන්නෙන් අට්ඨකථාචාරීන්වහන්සේ විසින් තෝරාතිබේ.

4. සු. ප්‍ර. ශ්‍රමණ දුස්සීලයා සෙවනයකිරීම අපායෝත්පත්තිවීමට හේතුද? නැද්ද?—ර, උ. දුෂ්ටානුගතියට පැමිණියහොත් අපායොත්පත්තිවීමට හේතුවෙනවා ඇති. *b*

---

*a. a. a.* මෙයින් ශ්‍රමණදුශ්ශීල සෙවනාදිය නොකටයුතුබැව් රතනපාල ස්ථවිරයෝම කියාතිබේ. මෙය ඔහුගේ 2 වෙනි ප්‍රශ්නකාවට නොගැලපේ. නොකටයුතු සෙවනාදිය “ දන්දීමේදී කටයුතුය ” යි වදාලසේක්ද?

*b.* දුශ්ශීල උපස්ථානය ත්‍රන්භාගව දුෂ්ටානුගතියෙන් තොරවූ සේවනයක් නොලැබෙන්නේය. දුෂ්ටානුගතියට නොබැඳී සෙවනාදියෙන් යුක්තව උපස්ථාන කලහැකිනම් එයද වදාරණසේක. එසේ නොවදාරා ප්‍රායාදුශ්ශීලයාහට හිඟමන් දියයුතුයයි වදාලහෙයින් රතනපාල ස්ථවිරයන්ගේ මේ උත්තරය ප්‍රලාපයකි.

5. සු. ප්‍ර. ශ්‍රමණදුශ්ශීලයෙක් සේවනාදිය නොකරණ පුත්ගලයා ඔහුගේ දුෂ්ටානුගතියට පැමිනේද? නැද්ද?—ර. උ. ශ්‍රමණ දුශ්ශීල යෙක් සෙවනාදිය නොකරණ පුත්ගලයා ඔහුගේ දුෂ්ටානුගතියට පැමිණෙන්නේ නෑ. *b b*

6. සු. ප්‍ර. ශ්‍රමණදුශ්ශීලයා හට සිවුපසය අනුදැනවදාළාද? නැද්ද?. ර. උ. ශ්‍රමණ දුශ්ශීලයා ගැණ අනුදැනවදාළ එකම ශික්ෂාපදයකුත් නැතිහියා සිවුපසයගැණ ශික්ෂාපදයකුත් නැත්තේය. *C*

7. සු. ප්‍ර. පාරාජිකාවී එසින් නොනැගිට එහිම සිටින ශ්‍රමණ දුස්සිලයාහට ගෘහස්ථ තිසරණයක් තිබෙනවාය කියා ඔබවහන්සේලා ගෙන් අවසර ලැබෙනවාද?—ර. උ.........පළමු උපාසකභාවයට පා දක වශයෙන් තිබියිය ලෞකික සරණාගමනය ස්බන්ධභෙදයෙන්වත් දුෂ්ටිවිපැත්තියෙන්වත් නැතිවේනතුරු ඇතකියා අපි කියම්හ.

8. සු. ප්‍ර. ශ්‍රමණ දුශ්ශීලයාට දියයුතුයි ඔබවන්සේලාගෙන් අවසර ලැබෙන දනය තුදුස් පුත්ගලික දනායන් අතුරෙන් කිවෙනි දනායද? ර. උ.........ඔහු බෞධයෙක්හෙයින් දසවෙනි දනයට ඇතුළත්වෙයි.

මෙසේ දෙපක්ෂය විසින් ප්‍රශ්නොත්තරකර ඉවරවූ ඉක්බිති ප්‍රශ්න විචාරීම අත්හිටවා, විවාදය පිළිබඳ කරණු දෙශනාපාඨ කථාදිය දක්වා සම්පූර්ණ කරන්ට දයකපක්ෂය ඉල්ලාසිටියේය.

රතනපාල ස්ථවිරයෝ කථාවේ අන්තිමකාලය ගැණීමෙහි අදහසින් සුවර්ණජෝතියාසහ ස්වාමින්ට පළමුකොට කාරණා කියන්ට කිවේය. මෙම විවාදයට විහාරාධිපතියා විසින් අවසරය දුන් ලියවිල්ලෙහි 2 පටන් 5 තුරු කාලය නියමකරතිබුනුහෙයින්ද, කථාවට කාලය ඉතුරුව තිබුනේ මිනිට්ටු 30 ගණනක්හෙයින්ද, එක පක්ෂයකට දෙව රක් කථාකරන්ඩ ඉඩනැතිහෙයින්ද, සුවර්ණජෝතියාසහ ස්වාමීන් කාලය යෙදීමේ වැරැද්ද ප්‍රකාශකොට ඒගැණ දයක සභාව විසින් සුදුස්සක් කරන්ට ඕනෑයයි කිවේය. ඒගැණ යමක් කරන්ට සභාවට නොතේරෙණබැවි කියාහිටියබැවින් සුවර්ණජෝතියාසහ ස්වාමින් වහන්සේම “මාවිසින් දුන් ප්‍රථමකොට හොපමණ සත්‍යයක් කිවත් ඒ සියල්ල දෙවෙනි කථාවාරයේදි ඕනෑ නොකරණ කථා කිමෙන් මකාදමන්ට පුළුවන. දෙවෙනිව මට කථාකරන්ට කාලය නැතිහෙයින් මෙසේ මගේ කථාවෙන් ඇති ඵලය කිම. දෙපක්ෂය විසින් තුබූ මාතෘකාගැණ දෙපක්ෂය විසින් දෙශනාපාඨ කථාදියෙන් කරුණු දක්

---

*b. b.* “සෙවනය කරණ තැනැත්තාම දුෂ්ටානුගතියට පැමිනි මෙන් අපාගතවෙයි” යන මේ රාමඤ්ඤනිකායික සංඝයාගේ කියම නම රතනපාලස්ථවිරයන්ට නොදැනිම මෙයින් කියවීතිබේ. උපස්ථා නකිරීමේදි සෙවනාදියද දුෂ්ටානුගති ආදියද සියල්ලම ලැබෙනහෙයින් රතනපාලස්ථවිරයන්ගේ මේකියමනෙන් ඔහුගේ දෙවෙනි මාතෘකාව ඔහුට නොදැනීම අවලඟුඋනාද නැද්දැයි මධ්‍යස්ථව නුවනින් සොයා බැලියයුතු.

*C.* මෙය අඹතිබේදැයි ඇසුකල දෙල් තිබේයයි උත්තර දීම මෙනි. ඇසීමට නිසි උත්තරය දුන්නොත් තමන්ගේ වාදය එපමණින්ම බිඳී යනහෙයින් වසා උත්තරදුන් හැටි පෙණේද? “පටිච්ඡන්නො න ම ඤෙතානි තංජඤ්ඤා වසලො ඉති” යි වදාළලෙස තමන්ගේ වසලකම තමන්ම ප්‍රකාශකරගත්හැටි කදිමයි.

වීම විනා ඔවුනොවුන්ගේ කථාගැණ දෙස් දැක්වීමක් ඕනෑ නැත. එසේකිරීම දෙපක්ෂයටම සාධාරණය" යි කියේය. එහි යුක්තිය තේරූමිගත්තාවූ කාලුවල්ගොඩ විදනවගත්මයාවිසින් සභාව වෙනුවෙන් එය ස්ථිරකළේය. එවිට රතනපාල ස්ථවිරයෝ "අපේ කට බැඳතබන්ට කාටවත් බැරියයි" කියමින් ඊට අරෝකළේය. ඊටපසු විහාරාධිපතියාගෙන් තව පැයබාගයක් කාලය ඉල්ලූනමුත් ඉඩදෙන්ට බැරියයි කියේය. මෙසේ කථාවටම කාලය ගතවීමෙන් එපමණින්ම යන්ට සිදුවන්හෙයින් "මධ්‍යස්ථ ශ්‍රධාවන්තයෙකුටවත් ප්‍රයොජනවේව" යි සුවණ්ණජොත්‍යාසභ ස්වාමීන් විසින් "භගවතාහි අත්තනො සාසනෙ වත්තාරො පච්චයා න දුස්සිලස්ස අනුඤ්ඤාතා" යනාදීන් ශ්‍රමණ දුශ්ශීලයාහට සිවුපසය අනුදැන නොවදාළ අන්දමත් "අසඞ්ඛ්‍යංඝොපගගණානි" යනාදීන් ශ්‍රමණ දුශ්ශීලයාහට උපස්ථානකිරීමෙන් දායකයා අපාගතවනබවත් දක්වා උපසම්පන්න භික්ෂූන්ට පාරාජිකාවීමෙන් සරණාගමනපටන්කොට ඇති සියලුම ගුණ විනාශවනබව විසුද්ධිමාර්ග ටීකා ආදි පොත්වල "උපසම්පන්නානම්පි පාරාජිකා සමාපන්නියා" යනාදීන් ප්‍රකාශකොට දෙවදත්තාදි ශ්‍රමණ දුශ්ශීලයෝ මිථ්‍යාදෘෂ්ටිකයන්බව මනොරථපූරණියෙහි "ජඞ්ඝසතාරෙශ්සද්ධිං දෙවදත්තොචෙව අඤ්ඤෙච එවරූපා වෙදිතබ්බා" යනාදි පාඨයෙන් ඔප්පුදී ශ්‍රමණ දුශ්ශීලයා මොනම සරණයක්වත් නැති අසරණයෙක්බව ප්‍රකාශකරමින් ව්‍යක්ත කථාවක්කොට තමන්ට අයිති කාලයතුළ කථාව නිමකළේය.

තදනන්තරව රතනපාලස්ථවිරයෝ දන්දීමේදී අලොභ අදෙෂ අමොහ a කුසල් මුල් උපදින ආකාරයක් කියා දුස්සිලයාහට දන් දීමෙන් දායකයාගේ සිතේ උපන් කුසලසිත කෙසේ නැතිවෙනවාද? අජාතශත්‍රෑ රජ්ජුරුවෝ දෙවදත්තයාට උපස්ථාන කළේ පින් සලකා නොවෙයි. b බුදුන් මරවන්ට උපකාර කළහෙයින් ඊරජ අපායට ගියාය. cc දුස්සිලයන්ට බලදීම්වශයෙන් උපස්ථානකරණ අය අපාගත වෙත්මය c පින්සලකා දෙන අය කිසිකලක අපායට නොයති.

---

a එය මුසාවාදයකි! දුස්සිලයා සේවනාදිය කරමින් සිව්පසින් දන් දෙන දායකයාහට මොහ අකුසලමූලය මුත් කිසිකලක අමෝහ කුසලමූලය නූපදී. එහි මොහ අකුසලමූලයම අපායොත්පත්තියට කාරණයකි.

b එයද මුසාවාදයකි! දෙවදත්ත කථායෙහි රජ පළමුකොට සෑඞ් ගුණයට පැහැදී දෙවදත්තයාට උපස්ථාන කළබවත් පසුව පව්කාරයෙක්බව දැන පින් සලකාවත් කිසි උපස්ථානයක් නොකළ බවත් ප්‍රකාශ හෙයින් පින්සලකාම උපස්ථාන කළබව පැහැදිලිය.

cc එයද බොරුයි. බුදුන් මරවන චෙතනාවකින් කිසිම උපස්ථානයක් නොකළේය. දෙව්දත් තෙරගේ ඉල්ලීමට දුනුවායින් සහ නාලාගිරි හස්තියාද යැව්යේය—හෙද දුශශිල ආශ්‍රයේ දෙෂයෙනි.

c යසයි! වෙන තැන්වලදී "කොහොම දන්දුන්නත් පින් මිස පව් නැතැයි" කියන මේ රතනපාලස්ථවිරයෝ දැන්දැන් මෙසේ කියන්නා කරගම් පිටියේ වාදයේදී මිගෙට්ටුවත්තේ උන්නාන්සේ "රාමඤ්ඤනිකායිකයන්ට දන්දීමෙන් නම් අපාගත වෙත්" යයි කීවාක් මෙන් රතනපාල තෙරුන්ට මෙය සිහිමදවී කියවුනාවද්දෝ! නෑ රාමඤ්ඤනිකායික සංඝයා සමග තව දෙතුන්පලකට යනකොට අනිත් ටිකත් (මූලාපී කරණ දුශ්ශීලඋපස්ථානය වැරදිබවත්) තේරේවි.

උග්‍රනම් ගෘහපතියා දුස්සිලයන්ට උපස්ථාන කළේය. *d* එය බුදුන් විසින් ආශ්චර්ය අද්භූත කාරණයක් කොට වදාරා තිබේ. *e* පින් සල කා දුස්සිලයා සේවනභජනාදිය කරමින්ම උපස්ථාන කිරීමෙන් ලොභය දුරුවන නිසා පින්සිදුවෙනවාය. *f* සිව්පසය කියන්නේ විනයේදී කියන නමක්ය, සූත්‍රයේදී ඒවාටම දසදානයයි කියනවාය. අභිධර්මයේදී රූපදානයයි කියනවාය, හරිතකී කිවත් අරළු කිවත් දෙකම එකය, එමෙන් නම වෙනස්උනාට ගුණයෙහි කිසි වෙනසක් නැත්තේය, *g* යනාදින් තමන්ට අයිති කාලයත් ඉක්මවා අනාත රහිත කථාවක් කළේය. 2 වෙනි මාතෘකාවූ "ශ්‍රමණ දුශ්ශීලයාගේ සරණයගැණ කිසිවක් නොකියේය. *h*. පී. ඒ. පීරිස් මහතා විසින් නියම කාලයට වඩා කථාකිරීම අගතිය යයි සභාවේ ප්‍රකාශ කොට කථාව නවත්වනලදී. රතනපාල ස්ථවිරයෝ "කුණඩලිය ගඟ ගන්ට දුන්නේ නැතැ"යි කෝප පහළකළේය. සුවර්ණජෝතායාසභ ස්වාමින්වහන්සේ "මේ කියමන් ඉතා වැරදිය මිට කාලය ඇතිනම් කියයුතුදේ ඉතා බොහෝ තිබෙනවායයි" ප්‍රකාශකොට සපිරිවරින් වැඩියේය. අනතුරුව සභාව විසිර ගියෝය. එහි ඉතුරුවූ සියම් භක්තිකයන්ට තනිපිට ජයඝෝෂා කළේළු.

මෙතෙකින් වාදකථාව නිමියේය.

දුශ්ශීලපක්ෂයට ඇතුළත් රතනපාල ස්ථවිරයන් විසින්ම මේ වාද භූමියේදී "බලදිම් වශයෙන් උපස්ථානකිරීමෙන් අපාගතවෙත්ම යයි" ප්‍රකාශකළ හෙයින් යම් දායකවරු ශික්ෂාපද කඩකරගෙණ සිටින දුශ්ශීල භික්ෂූන්හට "මොහු කොහොමකළත් අපගේ ඥාතියෙකැයි හෝ ආචාර්යයෙකැයි හෝ අපේ ජාතියෙහි කෙණෙකැයි හෝ මට මෙනම් මෙනම් උපකාර ඇති කෙණෙකැයි හෝ පෙර පටන් අදහා ගෙණ ආ කෙණෙකැයි හෝ අපේ පන්සල දියුණුකරගෙණ සිටින්නෙකැයි හෝ" යනාදි යම් වැරදි කල්පනාවකින් පිවරාදිප්‍රත්‍යයෙන් උපස්ථානකිරීම බලදිමවන හෙයින් එසේ කරණ දායකවරු අපාගත වනබව රතනපාල ස්ථවිරයෝම ප්‍රකාශකළේවෙයි. සිල්වත් පක්ෂයට ඇතුළත් සුවර්ණජෝතායාසභ ස්වාමින්වහන්සේලාට දැනට තිබෙන්නේ "දුස්සිලයන් සෙවනාදියකිරීමෙන් පින්සලකායයි මොහයෙන්

---

*d*. *e*. එයද බොරුයි; ඔහු සංඝ උපස්ථානය කෙළේය; සඟමැද සැඟවී සිටිය පටිච්ඡන්න දුස්සිල අලජ්ජීන් නිසා සියලු සංඝයා ගැණ සිත කළකිරුවා නොගැණීමේ උතුම්කම ආශ්චර්යයක් කොට වදාළබව එහිසත්‍යයයි; පටිච්ඡන්න දුස්සිලයන් ගැණ කියයුතු දෙය ශික්ෂාපද කඩකරගෙණ සිටින ප්‍රසිඬ දුශ්ශීලයන් ගැණ කියා කුමට වෙහෙසෙනවාද? අහෝ මෙබඳු බොරු දෙසන්නේ බඩගෙඩිය නිසාවද.

*f* එයද බොරුයි! දන්දීම පිණිස දුස්සිලයන් සේවනාදිය කරන්ට තථාගතතෙමේ නොවදාළේය, නොවදාළ දෙය කිරීම පවිය.

*g* මෙයද බොරුයි! විනයෙහි දක්වන සිව්පසය දුස්සිලයන්ට තහනම්කළේය, සූත්‍රයෙහි දසදානය දුස්සිලයන්ට පැමිණිවිට දිම නියමය. සිව්පසය දසදානය යනමෙහි බලවත් විශෙෂය මෙයින් පෙණේ. හරිතකී අරළු දෙකම එකඋනත් ලා අරළුත් මෝරවච වේලිච්ච අරළුත් සමගුණයයි අරළුගුණ දන්නාවූ කවරෙක් කියයිද?

*h* බොරුකිමේ භයසහිතකමනිසා අතියශින් කියයුතුදෙය කියන්ට මතකනැතිවීයයි හඟිමු.

මුලාව අනුදන නොවදාළ සිව්පසයෙන් උපස්ථානකරණ දායකව
රුන්ටත් හෙතුවෙන් අවැඩ සිදුවන අන්දම ඔප්පුකිරීම පමණක්ය.
මින්මතු එසේ උපස්ථානකිරීමෙහි දොෂයෝ මෙහි ප්‍රකාශවන්නාහුය.
සත්පුරුෂයෝ එය මනාව ශ්‍රවණය කරත්වා.

1. පට්ඨානප්‍රකරණයෙහි "පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං
පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො" යි
යනාදිය වදාළහෙයින් ප්‍රථමකොට අකුසලයට හෙතු කුසලයක්ද, කුස
ලයට හෙතු අකුසලයක්ද, ඇති බව සිත්හි තබාගතයුතු. කුසලකර්ම
යෙන් අපායටද, අකුසලකර්මයෙන් දිව්‍යලොකයටද නොයන නමුත්
ඇතම් තැනක කුසලය අපායගතවීමට හා අකුසලය දිව්‍යලොකොත්
පත්තිවීමටත් හෙතුවන බවද; එබදු කර්මයන් බොධයන් විසින් නො
කටයුතුබවද; දතයුතුයි. 2. සතුන් මැරීම අකුසල්ය, මස් දන්දීම
කුසල්ය; දන්දීම පිණිස සතුන්මරා පින්සලකා මස් දන්දීමෙහි උපද
නාපුරිමදානචේතනාව සත්වඝාතනයට හෙතුවූ බැවින් එසේ දන්දෙන
දායකයාගේ අපායගමනට කුසලවූ ඒ දානචෙතනාව හෙතුවූයේය.
දන්දෙනපිණිස සොරකම්ආදිය කොට පින්සලකා දන්දීමෙහිද මෙලෙ
සය. 3. "මෙය නොකටයුතුය" යි තථාගතයන්වහන්සේ විසින් යමක්
වදාළසේක්ද, එයකිරීමඅකුසල්ය. ශ්‍රමණදුශ්ශීලයා පිළිකුල් කටයුතුය;
සෙවනය, භජනය, පයුරුපාසනය, නොකටයුතුය, දෘෂ්ටානුගතියට
නොපැමිණියයුතුයයිද; සර්වඥයන්වහන්සේ වදාළසේක. එසේම ඒ
දුස්සීලයා සෙවනය කරන්නවුන්හට සෙවනය බොහෝ දීර්ඝකාලයක්
මුළුල්ලෙහි අපායදුක් එළවායයිද; ඒ දුස්සීලයා කෙරෙහි පැහැදීමෙන්
ගුණ කීමෙන් ඒකාන්තයෙන් අපායගාමිවන බැව්ද; වදාළසේක.
4. පින්සලකා දන්දීමාදිය පිණිස දුස්සීලයා සෙවන භජනාදියකරණ
දායකයාගේ ඒ පුරිමදානචෙතනාව පසුව උපදනා අකුසලවූ සෙවනා
දියට හා අකුසලවූ ප්‍රශාදයටද ගුණකීමටද ප්‍රත්‍යයවේ. එහෙයින් පින්
සලකා "දන්දීම පිණිස දුස්සීල්සෙවනාදිය කටයුතුය" යි තථාගත
තෙමේ නොවදාළේය. 5. යටකිලෙස සත්වඝාතනාදියකොට දන්දෙන
දායකයාගේ අපායගමණට සත්වඝාතනයට හෙතුවූ ඒ කුසලදාන චෙත
නාව යම්සේ ප්‍රත්‍යයවේද? එමෙන් පින්සලකා උපස්ථානාදිය පිණිස
ශ්‍රමණදුශ්ශීල සෙවනාදිය කරණ දායකවරු ඒ දානචෙතනා හෙතු
යෙන් අපායභාගිවෙත්මය. එහෙයින් අජාත ශත්‍රුරජද දෙවදත්තයා
කෙරෙහි ආ ස්ථානයේ පැහැදී කළ උපස්ථානයෙන් අපායගතවූබව
දක්වමින් "**අසන්තානංයො පග්ගණ්හාති**" යනාදිය වදාළසේක. 6. මේ
ගැන කියයුතු කරුණු තව බොහෝ ඇති නමුත් මෙපමණක්ම මිට
ප්‍රමාණහෙයින්ද දැනට අච්චුගැසී තිබෙන දුශ්ශීලසංග්‍රහ හෙදයෙහිද,
"පානදුරේ අභිනව වාදය" යන පොතෙහිද, භික්ෂුශීලයේ නවවෙනි
පරිච්ඡෙදයෙහිද, මෙය විස්තරව ඇති හෙයින් මෙපමණින් නවතමු.
සුධීන් විසින් ඒ පොත් රැගෙණ බලා විස්තර දැනගතයුතුයි.

මෙතෙකින් දුශ්ශීලඋපස්ථාන දොෂ කථාව නිමියේය.

දැන් ශ්‍රමණ දුශ්ශීලයාගේ **සරණාගමණවිභාගය**
දක්වනුලැබේ. 1. එහි සරණය, සරණාගමණය, සරණ යන්නාය,
යන මේ ත්‍රිකය ප්‍රථමකොට දතයුතු. එහි බුද්ධාදි රත්නත්‍රය සරණනම්
වේ. රත්නත්‍රයෙහි විද්‍යමාන සුවිසිමහාගුණය අරමුණුකොට සරණා
ගමණ උපක්ලෙශයන් විෂ්කම්භනය කරමින් "මෙය මට උතුම් පිහි
ටය" යි උපදනාශ්‍රද්ධාමූලික සම්‍යක්දෘෂ්ටි චෙතනාතොම සරණාගමණ

නම්වේ. ඒ මේ සරණාගමණයතෙම සර්වඥශාසනයට බැසගන්නා මාර්ගයකි. ඒ සරණාගමණ චෙතනායෙන් යුත් පුද්ගලතෙම සරණ යන්නේ වේ. 2. මෙසේ කියනලද සරණාගමණයතෙම පුද්ගල වශයෙන් හා සමාදානවිධි වශයෙන් ගිහිසරණය ප්‍රව්‍රජ්‍යාසරණයයි ද්විවිධ වේ. උපාසකභාවයෙන් ශාසනයට බැසගැණීමෙහි උපදනා චෙතනාතොම ගිහිසරණයයි කියනුලැබේ. ප්‍රව්‍රජ්‍යාභාවයෙන් ශාසනයට බැසගැණීමෙහි උපදනා චෙතනාතොම ප්‍රව්‍රජ්‍යාසරණයයි කියනුලැබේ. ද්විවිධවූ මේ සරණාගමණයාගේ ප්‍රථමකොට ප්‍රව්‍රජ්‍යාසරණයෙහි පිහිටා අනතුරුව ගිහිසරණයෙහි පිහිටියයුතුයයි හෝ ප්‍රථමකොට ගිහිසරණයෙහි පිහිටා පසුව ප්‍රව්‍රජ්‍යාසරණයෙහි පිහිටියයුතුයයි හෝ අන්‍යොන්‍ය මිශ්‍රභාවයක් නැත්තේය. 3. මෙසේ ද්විවිධවූ ලෞකික සරණයාගේ බිඳීමතෙම සාවද්‍ය භෙද(දුඃඛවිපාක සහිතව බිඳීම.) අනවද්‍ය භෙද (දුඃඛ විපාකරහිතව බිඳීම) යයි දෙයාකාරයකි. "සාවජ්ජා අඤ්ඤසත්ථාරාදිසු පණිපාතනාදීහි හොති" යනු කිහෙයින් අන්‍ය ශාස්තෘ ආදීන් කෙරෙහි ප්‍රණිපාතනාදිය කිරීමෙන් හෙවත් ශාශ්වතොච්ජෙදමිත්‍යාදෘෂ්ටි සමාදානයෙන් ගෘහස්ථයාගේ සාවද්‍යසරණභෙදය වේ. විනයෙහි "සාමණෙරොති අන්තමසො කුන්තකිපිල්ලිකම්පි මාරෙතබ්බො" *a* යනාදිය හා යටකි "උපසම්පන්නානම්පි පාරාජිකා සමාපන්නියා" *b* යනාදියද කිහෙයින් පාරාජිකාවීමෙන් සාමණෙර උපසම්පන්න භික්ෂූන්ගේ සාවද්‍ය සරණභෙදයවේ. ශාශ්වතොච්ජෙද දෘෂ්ටි සමාදාන මාත්‍රයෙන් උපසම්පන්න භික්ෂුහට සරණභෙදයක් නැත්තේය. කාරණකිම:—ඥප්ති චතුර්ථ කර්මයෙන් පිහිටි උපසම්පදා කර්මය දෘෂ්ටි විපන්නමාත්‍රයෙන් අවිනාශවන බැවිනි "අනවජ්ජාකාලකිරියාය" යි. කිහෙයින් ගිහිපැවිදි උභයපක්ෂයගේම කාලක්‍රියායෙන් අනවද්‍ය සරණභෙදයවේ. "සාමණෙරොහොමි උපාසකොහොමි" යනුද, තත්පරියාය වචනද හැර අන් කිසිආකාරයකින් ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙන්ද උපසම්පන්න භික්ෂූන්ගේ අනවද්‍ය සරණභෙදයවේ. සිවුරු හැරීමෙන්ද සාමණෙරතැන්ගේ අනවද්‍ය සරණභෙදයවේ. "සාවජ්ජා අඤ්ඤසත්ථාරාදිසු පණිපාතනාදීහි හොති" යනාදී සූත්‍රයෙහි කියනලද ඒ සරණභෙදය ගිහි සරණයගැණ සර්වප්‍රකාරයෙන් යෙදේ. ඒකදෙශයකින් ප්‍රව්‍රජ්‍යා සරණයගැණද යෙදේ. භෙද පාරාජිකාවකි. 4 මෙසේ ආගමනියමහෙයින් යම්සේ බුන්සරණ ඇති ගෘහස්ථයාහට නැවත සරණයෙහි පිහිටනතුරු සරණාගමනාදි කිසිමශාසනික ගුණයක් නැත්තේද එමෙන් පාරාජිකාවූ ශ්‍රමණදුස්සීලයාහට එයින් නැගිටිනතුරු ශාසනික කිසිම ගුණයක් නැත්තේය. එහෙයින් පරිජීඅවන් ශ්‍රමණදුස්සීලයාගේ සුද්ධිය දක්වන බුඞමතය දන්නා අර්ථකථාචාර්යයෝ "ගිහිබවට පැමිණ ත්‍රිසරණයෙහි පිහිටා පන්සිල් රැකීමෙන් උපාසකධර්මයහෝ ප්‍රව්‍රජ්‍යා සරණයෙහි පිහිටා දශසිල් රැකීමෙන් මහණදම හෝ රක්ෂාකළයුතුබැව් වදළේය. ඒනිසාම අග්ගික්ඛන්ධොපම සූත්‍රදෙශනාව ඇසීමෙන් ලේවමණකළ සැටක්පමණ භික්ෂූහු උපන් සංවෙගයෙන් උපසම්පදා ව්‍යවහාරය හැර සාමණෙර සරණයෙහි පිහිටා දස සිල් රක්ෂාකළබව හා සැටක් පමණ භික්ෂූහු උපසම්පදාව හැර ගිහිබවට පැමිණ නැවත ත්‍රිසරණයෙහි පිහිටා පන් සිල් රක්ෂාකළබව අර්ථකථායෙහි පෙණේ.

---

*a*. *b*. මේ පාඨවල විස්තර භික්ෂුශීලයේ දසවෙනි පරිච්ඡෙදයේ සාමණෙරශීල ප්‍රශ්න විසර්ජණයෙහි බලනු.

5. එහින් ගිහිබවට පැමිණි සැටනම ගැණ **මනොරථපූරණී**යෙහි
මෙසේ කියනලදී-"**තස්සා අලජ්ජිනී යාවජීවං** ඉමං පටිපත්තිංපූරෙ
තුං, සික්ඛං පච්චක්ඛාය උපාසකධම්මං පූරෙත්වා දුක්ඛාමුච්චිස්සාමාති,ගිහි
භාවං උපසංකමිංසු, තෙ තිසුසරණෙසු පතිට්ඨාය පඤ්චසීලානි රක්ඛිත්වා
උපාසකධම්මං පූරෙන්තා කෙචිසොතාපන්නා කෙචි සකදාගාමිනොජා
තා-භාවය:-අපවිසින් දිවිහිමියෙන් මේ ප්‍රතිපත්තිය පූරණය කිරීම
නොහැක්කේය, "ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානකොට (උපසම්පදාවහැර) උ
පාසක ධර්මය පුරා දුකින් මිදෙන්නෙමු" යි ගිහිබවට පැමිණියාහුය,
ඔව්හු නැවත ගිහි තිසරණයන්හි පිහිටා පන්සිල්රැක උපාසකධර්මය
පුරන්නාහු සමහරකෙනෙක් සොවාන්වූහ සමහර කෙනෙක් සකෘ
දාගාමීවූහ. "අපි ගිහියෝ වෙමුයි" ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානකොට ගිහිබ
වටපැමිණි ඔවුන්ගේ ලෞකික ප්‍රව්‍රජ්‍යා සරණය ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන
යෙන් අනවද්‍ය භෙදවශයෙන් බිඳීගියහෙයින් නැවත ගිහිතිසරණ
යෙහි පිහිටිබැව් මෙයින් පැහැදිලිව ප්‍රකාශවේ. දුශ්ශීලපක්ෂයෙහිවූ රත
නපාල ස්ථවිරාදීන් විසින් කියනලෙස බුන්සරණ ඇති පැවිද්දන්ට
ගිහි තිසරණයක් තිබේනම් හෝ, ඒ සිවුරුහැරිය හැටිනමට ප්‍රථමගත්
තිසරණය තිබුනානම් හෝ නැවත "තිසුසරණෙසු පතිට්ඨාය" යනු
වෙන් "ගිහි තිසරණයෙහි පිහිටා" යයි කියන්ට ඕනෑ නැත. සික
පස්විකිමෙන් සියලු ගුණ බිඳීගියහෙයින් නැවත ගිහිතිසරණයෙහි පිහි
ටිබැව් මෙයින් සැකනැර දතයුතු. පාරාජිකාවීමෙන්වන සාවද්‍ය සර
ණභෙදයෙහිද මෙලෙසමය. මෙහි වාදකථාවෙහි පෙණෙනලෙස සු
**වණ්ණජොති** සහ ස්වාමීන් විසින් 7 වෙනි ප්‍රශ්නයෙන් අනු
යොගකරණලද රතනපාල ස්ථවිරයන්ගේ එම 7 වෙනි උත්තරය
"**තිසුසරණෙසු පතිට්ඨාය**" යනාදීන් කියනලද මෙම ආගමනියම
යෙන්ම ව්‍යර්ථව නිෂ්ඵලව ගියබව දතයුතුයි.

6. **පචිත්ති** පොතෙහි "**තෙන්ඛො පන සමයෙන** අරිට්ඨස්සනාමභි
ක්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං
හොති" "තථා'හංභගවතා ධම්මංදෙසිතං ආජානාමි, යථා යෙමෙ අ
න්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරා
යා යාති" යනුවෙන් "එසමයෙහි වනාහි පෙර ගිජුලිහිණින් මරණ
වැදිකුලයෙහි උපන් **අරිට්ඨනම්** භික්ෂුහට 'බුදුන් විසින් යම් මේ අන්ත
රායකර ධර්මකෙණෙක් යම් පරිද්දකින් වදාරණලද්දාහුද? (එය) සේව
නයකරන්නාහුගේ ස්වර්ගමොක්ෂ අන්තරාය පිණිස ඒ ධර්මයෝ නොපො
හොසත්හයි' බුදුන් විසින් දෙශනාකරණලද ධර්මය මම එපරිද්දෙන්
දනිමි" යි මෙබඳු ලාමකවූ අකිරියවාදයයි කියනලද උච්ඡේදදෘෂ්ටි
යක් උපන්නේවෙ" යි දක්වනලදී.

**මහාතණ්හාසංඛය** සූත්‍රයෙහි:-"**තෙනඛොපනසමයෙන** සාති
ස්සනාමභික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං—පෙ—යථාහදෙ 'විඤ්ඤා
ණං සන්ධාවති සංසරති අනඤ්ඤන්ති' යනුවෙන් "එසමයෙහි
වනාහි කෙවට්ටපුත්‍රවූ **සාතිනම්** භික්ෂුහට "යම්හෙයකින් (වර්තමාන
භවයෙන් චුතවන සත්වයාගේ)ඒ මේ විඥ්ඥාණයම (අනාගත භවයෙහි)
මනාකොට දුවයිද, මනාකොට හැසිරෙයිද, අනික් විඥ්ඥාණයක්
නොදුවයිද නොහැසිරෙයිද, බුදුන්විසින් දෙශනාකරණලද ධර්මය
මම එපරිද්දෙන් දනිමි" යි මෙබඳු ලාමකවූ නිත්‍යපරිකල්පිත ශාශ්වත
දෘෂ්ටියක් උපන්නේවෙ" යි කියනලදී.

7. මිථ්‍යාදෘෂ්ටිහු වනාහි ස්වර්ගමොක්ෂාවරණ දෘෂ්ටිහුය, මොක්ෂාවරණදෘෂ්ටිහුය, ස්වර්ගමොක්ෂාවරණ නොකරණ දෘෂ්ටිහුයයි කොටස්වශයෙන් ත්‍රිවිධවෙත්. එහි අහෙතුකදෘෂ්ටි, අකිරියදෘෂ්ටි, නත්ථිකදෘෂ්ටි යන ත්‍රිවිධ නියතමිථ්‍යාදෘෂ්ටිහු ස්වර්ගමොක්ෂාවරණ දෘෂ්ටිහුවෙත්. '**රූපං අත්තතො සමනුපස්සති**" යනාදින් දක්වනලද් දසවස්තුක අනන්තග්‍රාහික මිථ්‍යාදෘෂ්ටිහු මොක්ෂාවරණ දෘෂ්ටිහුවෙත්. "**අහං නු ඛො ස්මි නො නු ඛො ස්මි**" යනාදින් කියනලද විසති වස්තුක සක්කාය දෘෂ්ටිහු ස්වර්ගමොක්ෂාවරණ නොකරණ දෘෂ්ටිහුවෙත්. චතුක්කඞ්ගුත්තර **උරුවෙලවග්ග**අටුවාවෙහි "**අහෙතුක වාදති නත්ථි හෙතු** නත්ථි පච්චයො සත්තානං විසුද්ධියාති එවංවාදිනො, අකිරියවාදති කරතො නකරීයති පාපන්ති එවං කිරියපටික්ඛෙපවාදිනො, නත්ථික වාදති නත්ථිදින්නන්ති ආදිවාදිනො" යනු කිහෙයින් සත්වයන්ගේ ශුද්ධිය පිණිස හෙතු ප්‍රත්‍යයක් නැතැයි ගන්න දෘෂ්ටියද; කරන්නාහට පාපයක් කරණු නොලැබෙයි ගන්නාවූ දෘෂ්ටියද; දුන්දෙයෙහි පල නැතැයි යනාදින් ගන්නාවූ දෘෂ්ටියද; පිලිවෙළින් අහෙතුක, අකිරිය,නත්ථික, දෘෂ්ටිහුයයි දතයුතු. මෙහි අහෙතුක, අකිරිය, දෘෂ්ටිදෙක ශාස්වතදෘෂ්ටිහුය; නත්ථිකදෘෂ්ටිය උච්ඡෙද දෘෂ්ටියය. **සාමඤ්ඤඵලසූත්‍ර**අටුවාවෙහි "**තත්ථ පූරණො** "කරතො නකරීයති පාපන්ති" වදන්තො කම්මං පටිබාහති, අජිතො "කායස්සභෙද උච්ඡිජ්ජ" තීති වදන්තො විපාකං පටිබාහති, මක්ඛලී "නත්ථිහෙතු" ති වදන්තො උභයම්පි පටිබාහති" යනු කිහෙයින් පූරණකාශ්‍යපතෙම කර්මයක් නැතැයි කියන්නාවූ අකිරිය දෘෂ්ටිකයා බවද; අජිතකෙසකම්බලීතෙම විපාකයක් නැතැයි කියන්නාවූ නත්ථිකදෘෂ්ටිකයා බවද, මක්ඛලීගොසාලතෙම කර්මවිපාක දෙකම නැතැයි කියන්නාවූ අහෙතුක දෘෂ්ටිකයා බවද, ප්‍රකාශවේ. එහිම "**තත්ථ කම්මං පටිබාහන්තෙනාපි** විපාකො පටිබාහිතො හොති, විපාකං පටිබාහන්තෙනාපි කම්මංපටිබාහිතං, ඉති සබ්බෙපි එතෙ අත්ථතො උභයපටිබාහිකා අහෙතුකවාද චෙව අකිරියවාදච නත්ථිකවාදච හොන්ති" යනාදින් ඒ දෘෂ්ටීන්ගේ මිශ්‍රත්වය කියනලදී. එහිම යම් කෙණෙක් වනාහි ඒ පූරණකාශ්‍යපාදින්ගේ ලබ්ධියක් ගෙණ රාත්‍රිස්ථානදිවාස්ථානයන්හි උන්නාහු හදාරද්ද, විමසද්ද, ඔහුට "කරන්නහුවිසින් පාපය කරණු නොලැබේ, හෙතුවක් නැත්තේය, ප්‍රත්‍යයක් නැත්තේය, මැරුණහුගේ චිත්තය මුල්සිඳේය" හි එම අරමුණෙහි මිථ්‍යාස්මෘතිතොම සිටිද, සිත එකඟවෙයිද, ජවනයෝ දුවද්ද, පළමුවෙනි ජවනචිත්තයෙහි සුවකළ හැකිවූවාහු වෙත්. 2. 3. 4. 5. 6. වෙනි චිත්තයන්හිද සුවකළහැකිවූවාහු වෙත්. සත්වෙනි ජවනචිත්තයෙහි බුදුවරයන්හටද සුවකළ නොහැක්කාහුවෙත්. නොනවත්නාහු වෙත්. (යටකි) අරිඨභික්ෂුව (සාතිභික්ෂුව) කණ්ඨක සාමණෙරයන් සමානයහ" හි දක්වනලදී. මෙසේ දක්වනලද පරිද්දෙන් අන්තිම මහාසාවද්‍යවූ නියතමිථ්‍යාදෘෂ්ටිය ගෙණ තිත්ථිකවූත සමාදම්නොවී ශ්‍රමණවේසයෙන් වඤ්චණනක් නමුත් සිටින්නාවූ උපසම්පන්න භික්ෂූන්ගේ ලෞකික සරණය දෘෂ්ටිවිපන්නමාත්‍රයෙන් පාරාජිකා නොවන හෙයින් නොබිඳෙන්නේය.. එහෙයින් ඒ දෘෂ්ටිවිපන්න භික්ෂුහට දෘෂ්ටිය අත්නොහැරීමෙහි /උක්ඛිත්තකර්මය කටයුතුයයි වදාළසේක. ඒ බව අරිඨශික්ෂාපදයෙන් ප්‍රකාශවේ. එහෙයින් "ශාස්වතොච්ඡෙද දෘෂ්ටිසමාදානමාත්‍රයෙන් උපසම්පන්න භික්ෂූහට සරණභෙදයක් නැත්තේය. කරුණු කිම? ඥත්තිචතුත්ථකර්මයෙන් පිහිටි උපසම්පදකර්මය දෘෂ්ටිවිපන්න මාත්‍රයෙන් අවිනාශවන බැවිනි" යන

මේ අර්ථය අපවිසින් කියනලදී. උපසම්පන්නයන්ගේ ලෞකිකසරණාගමණ උපාසකාදීන්ගේ සරණාගමණමෙන් දෘෂ්ටිවිපන්නමාත්‍රයෙන් බිඳේය” යි හඟිමින් රතනපාල තෙරුන් විසින් මුලාවෙන් අසනලද මෙහි වාදකථායෙහි පෙණෙන ඔහුගේ 6 වෙනි ප්‍රශ්නයද එයින්ම (දෘෂ්ටිවිපන්න උපසම්පන්නයාහට උක්ඛිත්තකර්මය කරන්ට වදළහෙයින්ම) නිෂ්ඵලවූබව දතයුතු.

8. **විනයසඞ්ග්‍රහටීකා**යෙහි සාමණේර පාරාජිකා ගැණ–“ **අවණ්ණං භණන්තො** අවණ්ණගමාති ආදිනා සංසම්පේඛ දෙසාපෙත්වා සරණසීලං දූසෙන්ති අධිප්පායො, පාරාජිකත්තා තෙසං, තෙනාහ ලිඞ්ගනාසනාය නාසෙතබ්බොති ” යනුවෙන් “ වහන්ස! වරදතෙම මා ඉක්මගියේය යනාදීන් සඟමැද දෙසවා සරණශීලය දියයුතුයි. ඒ දෘෂ්ටිවිපන්න සාමණේරවරුන්හට පාරාජිකාබැවිනි, එහෙයින් ලිඟනාසනායෙන් නැසියයුතුයයි ” කීහෙයින්ද–දෘෂ්ටිවිපත්තියට පැමිණීමෙන් සාමණේර තැන්හට පාරාජිකාවන බව දතයුතු. එහෙයින් දෘෂ්ටිවිපන්නමාත්‍රයෙන් සාමණේරතැන්ගේ සාවද්‍යසරණභෙදයවේ. උපසම්පන්න සාමණේර දෙදෙනාගේ සරණාගමණයෙහි ඇති මහත්වූ ප්‍රභෙදයද මෙයින් දතයුතු.

මෙසේ උපාසක, සාමණේර, උපසම්පන්න යන තුන්දෙන සම්බන්ධ සරණාගමණයන්ගේ මහත් විශෙෂඇතිහෙයින් ඔවුන්ගේ බිඳීමෙහිද මහත් විශෙෂයෝ ඇතිවියයුතුහ. සූත්‍රයෙහි උපාසකයාගේ ලෞකික සරණාගමණ ප්‍රධානකොටගෙණ පොදුවශයෙන් සරණාගමණයාගේ සාවද්‍ය අනවද්‍ය භෙදය දක්වා විනයෙහිදී “ සාමණේරොහි අනත්ත සො ” යනාදින් හා “ උපසම්පන්නානම්පි ” යනාදියෙන් සාමණේර, උපසම්පන්න දෙදෙන සම්බන්ධ ලෞකික ප්‍රව්‍රජ්‍යාසරණයාගේ විශෙෂ භෙදයන් දක්වූහෙයින් එම අර්ථ ස්ඵුටයි. මෙම සරණාගමණවිභාගයේ 3 වෙනි අධ්‍යාය අවසන්කොට ඇති සරණභෙදවිනිශ්චය අප විසින් එමනිසා කියනලදබැව් දතයුතු.

9. ශ්‍රමණදුශ්ශීලයා සරණ ගමනාදි කිසිත් ශාසනික ගුණයක් නැත්තාවූ මිථ්‍යාදෘෂ්ටින්ට අනුලොම් පුද්ගලයෙක්බව දක්වීමට ඇති බොහෝ කරුණු අතුරෙන් දුන් මදක් මෙහි දක්වනුලැබේ. ශ්‍රමණ දුශ්ශීලයා වනාහි සියලු අධිගමසැපතින් පිරිහුනාවූ නිර්වාණ ප්‍රාර්ථනා රහිත පුත්ගලයෙක්බැව් **නිරාශ සූත්‍රයෙන්** *u* ප්‍රකාශවේ. යවකොත

---

*u* තදර්ථකථාලීනාර්ථවර්ණනායෙහි “ **ලොකුත්තර ධම්මූපනිස්සය ස්ස** නත්ථිතායාති, යස්සපනිට්ඨිතෙන සක්කා භවෙය්‍ය අරහත්තං ලද්ධුං, තස්ස පතිට්ඨාය භින්නත්තා වුත්තං ” යනුවෙන් “යම් ශීලයෙක්හි පිහිටි තැනැත්තහු විසින් අර්හත්වය ලබන්ට හැකිවේද සර්වඥණාව ගවූ සතරමහාශීල සඞ්ඛ්‍යාත ඒ ප්‍රතිෂ්ඨාව බිඳුනුහෙයින් නව ලොව්තුරුදම් ලැබීමට උපනිශ්‍රය නැතිබැවින් (නිර්වානප්‍රාර්ථනාරහිත හෙයින්) (නිරාසයයි) යන මෙය අටුවාහි කියනලදී”යි කියාතිබේ. මෙහි අර්හත්වය උත්කෘෂ්ටවශයෙන් වදළහ. “ **චතුපාරිසුද්ධිසීලම්පි** පබ්බජ්ජානිස්සිතමෙවාති ඉමිනා **පබ්බජ්ජූපගම සමනන්තර**මෙව චතුපාරිසුද්ධිසීලම්පි සමාදින්නමෙවහොතීති දස්සෙති ” යන මෙයින් සරණාගමණය සතරමහාසීලයෙහි මූලබැව් ප්‍රකාශවනහෙයින් පාරාජිකාවීමෙන් ඒ සරණාගමණපටන් ඇති සියලු ගුණ බිඳෙනබැව් “ තස්ස පතිට්ඨාය භින්නත්තා” යන මෙයින්ද ප්‍රකාශවේ.

දූෂ්‍යකරණ යවදූෂීන් (කාවුලු) දැනගත් ගොවිතෙම උගුල්ලා වැටේන් පිටතට යම්සේ නිරාලයව විසිකරදමයිද, එමෙන් කිසිත් ගුණානුභාවයක් නැත්තාවූ ශ්‍රමණදුස්සීලයා ශාසනයෙන් නෙරපාදමන්ට වදාළ බව **යවදූෂි** සූත්‍රයෙන් පෙණේ. බත්සැළියෙහි නාවර පිසදැමීමෙන් දැලිකුණුවලින් හැවරුණු පරණ රෙදිකැබැල්ල සත්‍රිවරු කසලගොඩෙහි යම්සේ නිරාලයව විසිකරදමද්ද, එමෙන් ශ්‍රමණ දුශශීලයා ශාසනයෙන් නෙරපාදමණබැව් වදාළ බව **පොත්ථකූපම** සූත්‍රයෙන් ප්‍රකාශවේ. සඟ මැදට වැද ලොකයාගේ සිවුපසය සොරාකණහෙයින් "හොපි සියලුදෙන එකතුව ඒ දුස්සීලයා ශාසනයෙන් නෙරපව් හිසෙන් ගෙවත් කණෙණින්හෝ බෙල්ලෙන්හෝ ඇදදමව්" යයි වදාළබැව් **ධම්මචරිය** සූත්‍රයෙන් පෙණේ. වී අතුරෙහි ඇති බොල් වීමෙන් දුස්සීලයා සහමැද සිටියේ වී නමුත් සඞ්ඝයාකෙරෙන් (අහසට පොළොව මෙන්) දුරින්ම දුරයයි වදාළබැව් **පහාරාද** සූත්‍රයෙන් ප්‍රකාශවේ. බුධශාසනයට ඇතුළත් පුත්ගලයෙක් ගැණ මෙසේ නොවදූරණසේක.

10. තවද "**ඉතිබාහිරකචොරං** දසෙත්වා තෙනසදිසෙ සාසනෙ පඤ්ච මහාචොරෙ දසෙසතුං එවමෙවබොහි ආදිමාහ" යනාදි **පරමත්ථජෝතිකා** අර්ථකථායෙන් ශාසනයෙහි a සොරු පස්දෙණෙක් ඇතිබැව් දක්වනලදී. එයින් ශ්‍රමණදුශ්ශීලයාවනාහි පස්වෙනි මහසොරාය. "**චොරො සබ්‍රහ්මකෙ ලොකෙ** එසබො වසලාධමො" යනාදි දෙශනාවෙන් ඒ ශ්‍රමණ දුශ්ශීලවූ පස්වෙනි මහසොරා "බ්‍රහ්මයන් සහිත ලොකයෙහි කුසල් නැමති බඩු සොරකම්කරණ මහසොරෙක අධම වසලයෙකැ"යි වදාළේය. "විපන්නදිට්ඨිමායාවී තංජඤ්ඤා වසලොඉති" යනාදින් මිථ්‍යාදෘෂ්ටිකයා වසලයායයි වදාළපමණමුත් අධමවසලයායයි නොවදාළේය. එයින් ශ්‍රමණදුශ්ශීලයා මිථ්‍යාදෘෂ්ටිකයාහටද අධික පාපයෙක්බැව් පෙණේ. **චුඤ්ඤසුත්‍ර** අටුවායෙහි "ඉමස්මිංධම්මවිනයෙ වොහාරමත්තකෙන පටිඤ්ඤාතමත්තකෙනාපි පඤ්චමො සමණොනාම" යනාදියෙහි ප්‍රතිපක්ෂ අර්ථයෙන් "සඟපිරිසමැද සැඟවී සිටින්නාවූ ශ්‍රමණ දුශ්ශීලයා වොහාරමාත්‍රයෙන් නමින් පමණක් ශාසනයෙහි b සතරවෙනි ශ්‍රමණයාය" යි ප්‍රකාශවන්හෙයින් ශ්‍රමණ දුශ්ශීලයාහට ශාසනික ගුණයක් නැතිබැව් පෙණේ. සරණාගමනාදි ශාසනිකගුණයක් තිබේනම් සම්භාර්ථයෙන් ශ්‍රමණයායයි කියයුතුවේ. වොහාරමාත්‍රයෙන් ප්‍රතිඥමාත්‍රයෙන් ශ්‍රමණයායයි කියනලද වචනයම "ශ්‍රමණදුශ්ශීලයාහට සරණාගමනාදි ශාසනික ගුණයක් නැති බැව් දැනගැණීමට ප්‍රධාන ආගමනිදර්ශනයයි.

11. තවද, දෙවදත්තාදි ශ්‍රමණ දුශ්ශීලයෝද, පූරණකාශ්‍යපාදී මිථ්‍යාදෘෂ්ටිකයෝද, සෙවනාදිය නොටයුතු නොපිදියයුතු බාල පුද්ගලයන්බව මඞ්ගලසූත්‍රඅටුවාවෙන් ප්‍රකාශවේ. ශ්‍රමණදුශශීලයන් සෙවනාදිය කරන්නවුන්හට ඒ සෙවනාදිය පූරණකාශ්‍යපාදින් සෙවණය

---

*a b*. මෙහි ශාසනයෙහි සොරෙකැයි හැඟෙනහෙයින්ද, වොහාරමාත්‍රයෙන් ශාසනයෙහි ශ්‍රමණයායයි කිහෙයින්ද, එහි තත්වාර්ථය නොදන්නාවූ දුශ්ශීලපක්ෂය "ශ්‍රමණදුශ්ශීලයා ශාසනසට ඇතුළත් තිසරණය ඇති බෞධයෙකැයි" එයින් තේරුම්කරති. වොහාරමාත්‍රයෙන් නාමයෙන් පමණක් ශ්‍රමණයායයි කියනලද ඒ අර්ථකථාවචනයෙහි සම්පූර්ණ අර්ථය දිග දුරට [illegible]ගාබැලීමෙන් ඔවුන්ටම ඔවුන්ගේ ඒ තේරිම ව්‍යර්ථ වන්නේය.

කළ මිසදිටුවන්ටමෙන්ද, දෙව්දත්තෙර සෙවනය කළ කෝකාලික
අජාසත්තුරජ ආදි අයට මෙන්ද, අපාය දුක් ලැබෙන බැව් පුග්ගල
පඤ්ඤත්තිඅටුවාවෙන් පෙණේ. ශ්‍රමණදුශ්ශීලයෝ ශාසනයට ඇතුළත්
පුද්ගලයෝ නම් මිථ්‍යාදෘෂ්ටීන් සමකොට කුමට වදාරණසේක්ද? පූර
ණකාශ්‍යපාදි නියම මිසදිටුවෝද, වෙදදත්තාදීහුද, පාරාජිකාව් එහින්
නොනැගිට වසන අනිකුදු ශ්‍රමණදුශ්ශීලයෝද, විපර්‍යාසවූ දැකුම්
ඇති මිථ්‍යාදෘෂ්ටිකයන් බව **අඞ්ගුත්තර**අටුවාහි ප්‍රකාශවතිබේ. (භික්ෂු
**ශීලයේ 55 පිට ෭ මේ ලකුණ බලනු.)** බුදුසසුන් වැනසූ මහාසාංඝනි
කාදි වෛතුල්‍යයන් මෙන්ද, මහණවේශය සොරකම්කොටගෙණ ව
සන ථෙය්‍යසංවාසකයන් මෙන්ද, ශ්‍රමණදුශශීලයෝ (කිසිත් ශාසනික
ගුණයක් නැති)භික්ෂුව්‍යවහාරය පමණක්ඇති පාපිෂ්ඨ බව විමතිවිනෝ
දනියෙන් පෙණේ. මෙසේ ශ්‍රමණ දුශශීලයා පූරණකාශ්‍යපාදි නිය
තමිථ්‍යාදෘෂ්ටීන් හා මහාසඞ්ඝනිකාදි වෛතුල්‍යවාදීන් හා සමකොට
දක්වාවදාළහෙයින් ඒ සාගමයුක්තියෙන් ශ්‍රමණදුශශීලයා මිථ්‍යාදෘෂ්
ටිකොටසට ඇතුළත් පුද්ගලයෙක්බැව් ප්‍රකාශවනහෙයින් වාදකථා
යෙහි සුවණ්ණජෝතියාසභ ස්වාමීන් විසින් අසනලද (8) අටවෙනි ප්‍ර
ශ්නයට රතනපාලස්ථවිරයන් විසින් ශ්‍රමණදුස්සීලයා බෞද්ධයෙක්යයි
ගනිමින් දෙනලද ඔහුගේ 8–උත්තරයද ව්‍යර්ථවූ බව දතයුතු.

"**පාරාජිකොහොති සාසනතොචුතොති** වෙදිතබ්බො" යන මේ පද
යෙන්ම ශ්‍රමණදුශ්ශීලයා සර්වඥශාසනයෙන් චුතවූ පුද්ගලයෙක්බව සි
ක්ඛාපදවල**ඤ්ජනා**යෙන්පැහැදිලිවප්‍රකාශවේ. "සාසනායො පරාජි
තො"යන මෙයින්ද ඒ ශ්‍රමණ දුශශීලයා ශාසනයෙන් පැරදුනු පුද්ගල
යෙක්බව බුද්ධසික්ඛායෙන් ඉතාපැහැදිලිවේ. නොයෙක්දෙශනා,අර්ථ
කථා,ටීකා,,අනුටීකා,ප්‍රකරණාදියෙන් මෙසේ ප්‍රකාශවනහෙයින් ශ්‍රමණ
දුස්සීලයා සරණාගමණයපටන්කොටඇති සියලු ශාසනික ගුණයෙන්
පිරිහුනාවූ පුත්ගලයෙක්බැව් සහ ධාර්මිකව ඔප්පුවූයේය. එහෙයින් ශ්‍ර
මණදුශශීලයා කයෙන් පමණමුත් සිතින් ශාසනයට ඇතුළත් නොවූ
මිථ්‍යාදෘෂ්ටිපක්ෂයට ඇතුළත්වූ පුත්ගලයෙක්බැව් සැකහැර දතයුතු.

. රතනපාල ස්ථවිරාදි දුශශීලපක්ෂයගේ "ශ්‍රමණදුස්සීල. උපස්ථාන
වාදයහා ශ්‍රමණදුස්සීල සරණාගමණවාදය, යන වාද ශිල්පය මෙසේ
අපවිසින් දක්වනලද බොහෝ ආගම නිදර්ශන නැතත් "පාරාජිකො
හොති සාසනතො චුතොති වෙදිතබ්බො" යනමේ ආගමනිදර්ශන
නැමති වජ්‍රයෙන්ම සිදි බිඳී සුනුවිසුනුවීගිය බව දතයුතු. දුශශීලප
ක්ෂය විසින් මේ ගැණ එකිනෙකට උපදවන වාදයන් සිඳදමනු පිණිස
හා ඒ ගැණ වැඩිදුරට ආගමනිදර්ශනයන් ඉගැණ්මෙහි තත්පරවූවන්
පිණිස තව මදක් කරුණු ප්‍රකාශකරන්නෙමු.

12. "ශ්‍රමණ දුශශීලයාහට දසවෙනි පුද්ගලික දානය අයිතිබව
මොනමගකින් නමුත් ඔප්පුකරනොගත්තොත් මෙකළ ලක්දිව පව
ත්නා දුස්සීලවාදයෙන් මහත් පාඩුපැමිනෙත,, යනබයින් නැතිගත්
තාවූ දුශ්ශීලපක්ෂයට ඇතුළත් රතනපාල ස්ථවිරාදි පණ්ඩිත සම්මත
බොහෝ පැවිදිවරු "ලොකියස්සහි සරණාගමනස්ස දුවිධො භෙදො
සාවජ්ජො අනවජ්ජොච" යන අටුවාපාඨයෙහි එල්බී "ශ්‍රමණ දුශ්ශී
ලයා ලෞකික සරණයඇති බෞද්ධයෙක්ය" යි ගනිමින්'' ඕහට ස්ක
න්ධභෙදයටහා මිථ්‍යාදෘෂ්ටියට පැමිණෙනතුරු මහණවීමට ප්‍රථමගත්
ගිහිනිසරණය තිබේය" යි කියමින් "**සථාපුරෙතථාපච්ඡා**,, යනාදිය
හා "**සචෙපාසි දුස්සීලො** නාමතාසි දුස්සීලාවපන උපාසකා" යනාදි

යද නිදර්ශන කරත්. දුශ්ශීල පක්ෂයගේ එමවාදයෙන් උපාසකයෙක් හැර අනිකෙක් පැවිදිනොකළයුතුය" යි ආගම නියමයක් ඇතිවිය යුතුබැවිද ගැහේ. වර්තමානකාලිකවූ යටැකි පණ්ඩිත රංචුවගේ ඉතා මහත්වූ මේ මිථ්‍යා මතයෙන් මුළාවට පත්වන බෞද්ධ මහජනයාකෙරෙහි අනුකම්පාවෙන් එම කියමන දැන් විභාගකර බලමු. "උපසම්පද විමට පෙර යම්සේ අනුපසම්පන්නද එමෙන් පාරාජිකාවීමෙන් පසු ඒ ශ්‍රමණදුශ්ශීලයා සඞ්ඝයාගේ සංවාසයට අභව්‍යවූ අනුපසම්පන්නයෙක" යනමේ අර්ථය දක්වනපිණිස "යථාපුරෙතථාපච්ඡා" යනාදිය වදාළ බව විනා ඔහුට ගිහිතිසරණයක් ඇතිබව එයින් කිසිසේත් ප්‍රකාශ නොවේ. "**කෙසු දුස්සිලෙසු සඞ්ඝං උද්දිස්ස**" යනමේ දෙශනා වචනයෙන් සමහර මෑඳබුඞ්හු "සිල්වත් සඞ්ඝයාය දුස්සිල සඞ්ඝයායයි සංඛ්‍යා දෙකොටසක්කොට විරුඬාර්ථයක් තේරුම්ගනිත්" යනබ සින් "**සඞ්ඝෙහි දුස්සීලො නාමනත්ථි**" කියාද–සිල්වත් උපාසකවරුය දුස්සිල උපාසකවරුයයි උපාසකවරුඅතර දෙකොටසක් ඇති හෙයින් ඒ අර්ථය දක්වනපිණිස "**දුස්සීලාච පනඋපාසකා**"යි අර්ථකථාචාර්‍ය්‍යයෝ විස්තරකළෝය. එයින්ද ශ්‍රමණ දුශ්ශීලයාහට ගිහි තිසරණයක් ඇතිබැව් කිසිසේත් නොහැගේ. දුශ්ශීල පක්ෂය විසින් ඒගැණ ගෙණපානා සාධකයෝ මෙසේ ව්‍යර්ථව ගියහ.

13. "**පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා**" යනාදින් ප්‍රව්‍රජ්‍යා පෙක්ෂක කුලදරුවාගේ ප්‍රථමකොට හිසරැවුල් හරවා කාෂායවස්ත්‍රයන් හඳවා භික්ෂූන්ගේ පාදෙස වඳවා උක්කුටුකයෙන් හිඳුවා "යමහංවදාමි තං වදෙහි" යිකියා "බුද්ධම් සරණම් ගච්ඡාමි" යනාදින් ප්‍රව්‍රජ්‍යාත්‍රිසරණයම දෙන්ට අනුදැනවදාළපමණමුත් එහි ප්‍රථමකොට ගිහිසරණයෙහි පිහිටුවා පසුව ප්‍රව්‍රජ්‍යා සරණ දෙන්ටයයි නොවදාළේය. එසේ නොවදාළහෙයින්ද—පැවිදි නොකටයුතුයයි වදාළකුට්ඨිකාදී තෙපණස් දෙනාහට අනුපාසකයා ඇතුළත්කර නොවදාළහෙයින්ද "උපාසකයෙක් හැර අනිකෙක් පැවිදිනොකළ යුතුය" යි ආගම නියමයක්නැතිබැව් පෙණේ. එහෙයින් ප්‍රව්‍රජ්‍යා පෙක්ෂක කුලදරුවෝ ප්‍රව්‍රජ්‍යා සරණාගමණයෙන්ම ශාසනයට ඇතුළත්වන්නෝය. මෙකළ පැවිදිකරවන්නකල්හි ගිහිසරණයෙහි ප්‍රථමකොට පිහිටවීම ආචීර්ණමාත්‍රමුත් අවශ්‍යකාර්‍ය්‍යයක් නොවේ.

14. පෙර උපාසක භාවයෙන් ශාසනයට බැස සිටියාවූ කුලපුත්‍රයෙක් යම්කලක පැවිදිවෙයිද; එකල්හි ඔහුගේ ගිහි තිසරණය එහිදීම පටිප්පස්සම්භණ වීම හෝ සාමණේර සරණයට ඇතුළත්වීම හෝ විය යුතු. නොඑසේනම් දුශ්ශීල පක්ෂය විසින් එසේ පැවිදිවූ පුද්ගලයාහට වෙනවෙනම තිසරණ දෙකක් ඇතිබැව් ආගමෙන් දක්වියයුතුවේ. "ලොකියස්සහි සරණාගමණස්ස දුවිධොභෙදො" යනාදියෙහි තත්වාර්ථයන් මෙහි දක්වාඇතිහෙයින් එය ඊට නිදර්ශනකිරීම නිෂ්ඵලයි.

15 තවද, පැවිදිවන කුලපුත්‍රයාගේ හිස රැවුල් නොඅරවා උභතො සුද්ධියෙන් දහස් වාරයක් සරණ සමාදම්කෙරෙව්වත් ගිහිලිඟය හරිණතුරු යම්සේ ප්‍රව්‍රජ්‍යාසරණ නොපිහිටයිද; එමෙන් ශ්‍රමණ දුස්සීලයාහට සිවුරු දරාසිටිනතුරු (මහණවෙස් හරිණතුරු) ගිහි තිසරණද නොපිහිටන්නේය. "ශ්‍රමණවෙස් නොහැරසිටින දුස්සීලයාහට ගිහි තිසරණයක් තිබෙනවාය" යි කියන දුශ්ශීල පක්ෂය විසින් හිස රැවුල් නොහරවා මහණවෙස් ගැන්වීමෙන් ප්‍රව්‍රජ්‍යා තිසරණය පිහිටන අන්දමක්ද දෙශනා අර්ථකථාදියෙන් දක්වියයුතුවේ. එසේ දක්වීමට

යත්නකරන්නාවූ දුශ්ශීල පක්‍ෂය වෙහෙසට පැමිනෙත්. අභිමතාර්ථය නොලබත්. එසේවූකල්හි "ශ්‍රමණ දුශ්ශීලයාහට සංඝභේදයට හා මිථ්‍යාදෘෂ්ටියට පැමිණෙනතුරු මහණවීමට ප්‍රථම ගත් ගිහි තිසරණය තිබෙය" යි දුශ්ශීල පක්‍ෂයගේ එම වාදය හිස්වන්නේය. ශ්‍රමණ දුශ්ශීලයාහට ගිහි තිසරණයක් නැතිබැව් යට දැක්වූ ආගම නියමයන් ගෙන් හා මේ දෙකාරණයෙන්ද නිශ්චිතවූයේය.

16 එහෙයින් උපාසකභාවයෙන් ශාසනයට බස්නා කුලපුත්‍රයන් හට යම්සේ සාමණේරභාවයක් නැත්තේද; එමෙන් සාමණේරභාව යෙන් ශාසනයට බටුවූ කුලපුත්‍රයන්හට උපාසක භාවයක්ද නැත් තේය. ඒනිසාම, යටකිලෙස පාරාජිකාවූ සාමණේර උපසම්පන්න දෙ පක්‍ෂයටම"නැවත ගිහිබවටහෝ සාමණේරබවට පැමිණ ගිහි තිසරණ හෝ සාමණේර සරණ සමාදම්ව සිල්රකින්ට" නියමකරවදාළේය. එහෙයින් පාරාජිකාවී එයින් නොනැගිට සිටියාවූ දෙවදත්තතෙමේ අපායට යනකල්හි තමන්ට කිසිත් සරණක් නොතිබූනහෙයින් "**ඉමෙහි අට්ඨිහි තමග්ගපුග්ගලං**, දෙවා'ති දෙවං නරදම්ම සාරථිං සමන්තචක්ඛුං සතපුඤ්ඤ ලක්ඛණං, පාණෙහිබුද්ධං සරණංගතො'ම්හි' යනමෙයින් ගිහි සරණ සමාදම්වූබව යසරහට පෙණේ.

දැනට වසන ශ්‍රමණ දුශ්ශීලයෝ දෙවේලේ මල් පහන් පුදමින් තෙ රුවන් අදහන ආකාරයක් ලොවට පෙන්වති. "එයින් ඔවුන්ට ගිහි තිසරණ පිහිටන්ටබැරිද" යි සමහරු සිතත්. නමුත් පාරාජිකාවී එය ප්‍රකාශනොකර සිවුරු දරාසිටීමෙහි වඤ්චාඅදහස සිතතුළ තිබෙණතුරු ආයුකල්පය මුලුල්ලෙහි බුදුන් වැන්දත් තෙරුවන් පිදුවත් සරණාග මණ චේතනාවක් ඔවුන්ට නූපදී. මෙසේ සහ ධාර්මිකව දක්වනලද නොයෙක් දෙශනා අට්ඨකථාදියෙන් ශ්‍රමණ දුස්සීලයා මිථ්‍යාදෘෂ්ටි කොටසට ඇතුළත්වූ පුද්ගලයෙක්බව සහ ඕහට ගිහිතිසරණය නැති බවද ප්‍රකාශවූහෙයින් දසවෙනි පුද්ගලික දානය අභිනිනැතිබවද එයින්ම ප්‍රකාශය.

18. **තවද**, "**ධමථෙතං භික්ඛවෙ නිද්ධමථෙතං භික්ඛවෙ**" යනාදියෙන් "මහණෙනි ඒ දුස්සීලයා සම්භොගයෙන් ඉවත්කරදමව් එපමණකින් නොනැවතී ඔහු ශාසනයෙන් නෙරපාදමව්" යනාදීන් වදාළාවූ තථාගතයන් වහන්සේ ඕහට "සිව්පසයෙන් සංග්‍රහකටයු තුයි හෝ ධර්මාසනාරූඪකොට ඔහුගෙන් බණ ඇසිය යුතුයයි හෝ ඕහට වැඳුම් පිදුම් කටයුතුයයි හෝ වදාළසේක්ය" යි දුස්සීලයෙක් හැර කවර බෞද්ධයෙක් කියයිද? භින්නසීලීව ශ්‍රමණවෙස්ගෙණ වසන්නාවූ අපායමාර්ගයට පිළිපන්නාවූ ඒ දුස්සීලයාගේ පින්සලකා දෙනලද චීවරාදි ප්‍රත්‍යය පරිභොගය ථෙය්‍ය පරිභොගය(හොරාකෑම) වේ. සරණගතිකයා පටන්කොට ඇති ශපත ශෛෂ්කයන්ගේ පරිභොගය දායජ්ජ පරිභොගය වේ. රහතුන්ගේ පරිභොගය සාමි පරිභොගය වේ. "ශ්‍රමණ දුස්සීලයා තිසරණය ඇති බෞද්ධයෙක් හෙයින් ඕහට දසවෙනි පුත්ගලික දානය අභිනියයි" කියන රතනපාල ස්ථවිරාදී දුශශීල පක්‍ෂය විසින් දුස්සීලයාගේ පරිභොගය දායජ්ජ පරිභොගයයි ආගමෙන් දක්විය යුතුවේ. එසේ දැක්වීමට අට්ඨකථා සහිත ත්‍රිපිටක බුද්ධවචනයෙන් එකද පාඨයකුත් නොලබන්නාවූ ර. ස්ථවිරාදීහු දුස්සීලයාහට දසවෙනි දානය අභිනිබැව් පෙන්වීමට අපොහොසත්හෙයින් වෙහෙසට හා බුදුන් රහතුන් කෙරෙහි අප්‍රත්‍යයටද පැමිණෙත්. සුරා සොණ්ඩයෙක්හට සුරාවවැනිවූ සිවුපසය, පරිභොගකරණ දුස්සීල

ශ්‍රමණයාහටද, සුරා සොණ්ඩියෙකුට ලොකයෙහි කුසලයයි සම්මත මජ්ජදානයෙන් පින්සලකායයි මුළාවී උපකාර කරන්නන් වැනිව දුස්සිල ශ්‍රමණයාහට පින් සලකායයි මුළාවීඋපස්ථානාදිය කරණ දායකාදින් හටද යටකිලෙසින් මහත් අනර්ථසිද්ධවනහෙයින් ඕහට තුදුස් පුද්ගලික දාන අතුරෙන් එකකුත් ආවේනිකව නොවදාළේය. එහෙයින් අර්ථකථාචාර්‍ය්‍යයෝ දුස්සිලයන්හටම අයිතිවූ දහතුන්වෙනි දාන යටවත් ශ්‍රමණදුශ්ශිලයා ප්‍රධානකොට නොදක්වා මච්ඡබන්ධ කෙවට්ටාදින් දක්වූයේය. ගෙදෙරට සිඟා පැමිණිකල්හිද ඔහුගේ දෙශ දක්නා උපාසකයා විසින් හුනස්නෙන් නොනැගිටියයුතුයයිද පෙරගමන් නොකටයුතුයයිද දෙය්‍යධර්ම්‍ය නොදියයුතුයයිද වදාරාතිබේ. යාචකභාවයෙන් පැමිණෙන්නාවූ දුස්සිලයන්හට හිඟමන් දියයුතුයයි වදාළ බැවින් ශ්‍රමණදුශ්ශිලයාද ඒ සංඛ්‍යාවට ඇතුළත්වීමෙන් ඕහට දෙන යාචකදානය දහතුන්වෙනි පුද්ගලික දානයෙහි ඇතුළත්විය හැකිබැව් පෙණෙන පමණමුත් කිසිසේත් නියම සිල්වතුන්ට අයිතිවූ දසවෙනි දානය ඕහට අයිතිවිය නොහැකිමය.

මෙතෙකින් ශ්‍රමණදුශ්ශිල **සරණාගමණ**
**විභාගකථාව** නිමියේය.


බුද්ධාගම්කාර සහෝදරවරුණි! නොයෙක්දෙශනා අර්ථකථානය ආශ්‍රයකොට අප විසින් ලියනලද මේ කරුණු නිකායභෙදදී කිසිවක් නොසලකා මධ්‍යස්ථව කිපවරක් කියවාබැලීමෙන් නුවනින් විමසා අසත්‍යය දුරලා සත්‍යය එලෙසින් බාරගැණීමෙන් අලජ්ජී දුශ්ශිල ආශ්‍රය නමැති අපායමාර්ගයෙන් ඉවත්ව කල්‍යාණමිත්‍ර ආශ්‍රයෙන් සද්ධර්මශ්‍රවණය ලබා යොනිසොමනසිකාරයෙන් ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි පිහිටා දිව්‍යමනුෂ්‍යසැප විඳීමෙන් කෙළවර උතුම් අමෘත මහා නිර්වානසම්පත් අත්පත්කරගැණීමට උත්සාහකටයුතු.

ශ්‍රමණදුශ්ශිල සරණාගමන විභාගය නිමි.

පරිජීවන්මහ ණා  සස්නෙහි සියලුගුණෙ  නා
පිරිහුනුබැව් වණා  මෙසේ කළගත් මෙයින් නිමු  නා
දුසිල් මහණුන්හට කරණ මෙහෙයෙන් සතහ  ට
වන අවැඩ දක්මට බලව් මෙමපොත රුගෙණ හැමවි ට

නිමි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු